[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 45 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 දෙසැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. **3. 50** තැපැල් ගාස්තුව : රු.**3.50**

## 1999 අංක 45 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වැනි දින.]

එල්. ඩී. – ඕ. 12/95.

### රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 1999 අංක 45 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 2 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- 434 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4අ) මේ පනතේ කාර්ය සඳහා, -

(අ) දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දුම්රිය ස්ථානාධිපති තනතුර දරන ; හෝ

(ආ) ශ්‍රී ලංකා පොලිස් උප සේවාවේ යම් තනතුරක් දරන,

තැනැත්තකු, ආණ්ඩුවේ සේවයේ විශ්‍රාම වැටුප් අහිමි තනතුරක් දරන්නකු ලෙස සලකනු ලැබිය යුතු අතර, වැටුප වෙනුවට ඒ තැනැත්තාට ගෙවනු ලබන මාසික දීමනාව, මාසික වැටුපක් ලෙස සලකනු ලැබිය යුතු ය."

3. ප්‍රධාන ප්‍රඥාප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සියයට හයක්" යන වචන වෙනුවට "සියයට අටක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයෙහි "සියයට හයක්" යන වචන වෙනුවට "සියයට අටක්" යන වචන ආදේශ කිරීමෙන් .

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "සියයට හයක්" යන වචන වෙනුවට "සියයට අටක්"යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

අතීතයට බලපෑම සහ වලංගු කිරීම.

**5**. (1) මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, -

(අ) දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දුම්රිය ස්ථානාධිපති තනතුර දරන තැනැත්තකුට අදාළ වන තාක් දුරට, ඒ සංශෝධනය, සියලු කාර්ය සඳහා, 1983 මැයි මස 01 වන දින දී බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, 1983 මැයි මස 1 වන දින සිට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින තෙක්, ඒ තැනැත්තාගේ වැටුපෙන් අඩු කර ගෙන අරමුදලට ගෙවන ලද අනිවාර්ය දායක මුදල් වලංගු ලෙස අඩු කර ගෙන එසේ ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) ශ්‍රී ලංකා පොලිස් උප සේවාවේ තනතුරක් දරන තැනැත්තකුට අදාළ වන තාක් දුරට, ඒ සංශෝධනය, සියලු කාර්ය සඳහා 1991 ජනවාරි මස 01 වන දින දී බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, 1991 ජනවාරි මස 01 වන දින සිට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින තෙක්, ඒ තැනැත්තාගේ වැටුපෙන් අඩු කර ගෙන අරමුදලට ගෙවන ලද අනිවාර්ය දායක මුදල්, වලංගු ලෙස අඩු කර ගෙන එසේ ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට මේ පනතේ 3 වන වගන්තිය මගින් කරනු ලැබූ සංශෝධනය, සියලු කාර්ය සඳහා, 1995 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එසේ සංශෝධිත පරිදි වූ ඒ වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ අනුව, විශ්‍රාම වැටුප් අහිමි සේවා නියුක්තයන්ගේ වැටුප් වලින් අඩු කර ගෙන 1995 ජනවාරි මස 01 වන දින සිට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය දක්වා වූ කාලය තුළ දී අරමුදලට ගෙවන ලද මුදල් ප්‍රමාණ වලංගු ලෙස අඩු කර ගෙන ඒ අරමුදලට ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.